SC

# ශ්‍රී ලංකාවේ පරිවාස භාරයට දරුවන් පත්වීම කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
01 JUN 2009
UNIVERSITY OF KELANIYA

පී.ජ්.එම්.එස්.පී. විජේසේකර

විභාග අංකය : FGS/S/2000/119/R

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සමාජීය
විද්‍යාපති උපාධි පරික්ෂණයේ අවශ්‍යතාවක් සපුරාලීම
සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන
පර්යේෂණ නිබන්ධය.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 506 |
| වර්ග අංකය | |

2001 නොවැම්බර්

# සාරාංශය

ළමා විය මිනිස් ජීවිතයෙහි එක් අවධියක් වේ. ළමා වියට හිමිවූ කායික මානසික නොමේරූ ස්වභාවය නිසා වැඩිහිටියන් විසින් ළමයාට ආරක්ෂාව හා රැකවරණය ලබාදීම අප සමාජය තුළ පිළිගත් සම්මතයකි. කුඩා බිළිඳකු මෙලොව එළිය දුටු මොහොතේ පටන් තමා අවට ලෝකය පිළිබඳ පළමුව දැනුම ලබා ගන්නේ පවුල තුළිනි. කුඩා කාලයේ සිට ළමුන් මාපියන්ගේ ආදරය, ආරක්ෂාව, පිළිගැනීම ලබාදීම තුළින් සමාජයට උචිත හැසිරීම් රටාවකට ඔවුන් පුරුදු වේ. ඒ අනුව දරුවන් යහපත් ගුණාංගයන් ඉගෙනීමට පුරුදු වේ. එමෙන්ම පවුල් පරිසරය තුළින් කෲරත්වයට ගොදුරු වූ දරුවකු වැඩිහිටියකු බවට පත්වීමේදී විකෘති මානසික තත්ත්වයෙන් යුතු පුද්ගලයකු බවට පත්වීමට පදනම සපයයි. බොහෝ ළමුන් මාපියන්ට අකීකරු වීම, කලහකාරී බව, දුම්පානය, මත්පැනට, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, අයාලේ ඇවිදීම, අධ්‍යාපනය අතහැර දැමීම වැනි ක්‍රියාවලට යොමු වන්නේ මෙම කරුණු නිසාය.

ළමා විය යනු අනුන් මත රැඳී ඇති අතිශයින්ම පීඩාවලට ගොදුරු විය හැකි අවධියකි. එමෙන්ම මෙම අවධිය ශාරීරික, මානසික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් වර්ධනය වන අවධියක් වන බැවින් දරුවන්ට පවුල් පරිසරය තුළින් ආරක්ෂාව හා රැකවරණය ලබාදීම අත්‍යවශ්‍ය කාරණයකි. එසේ රැකවරණය හා ආරක්ෂාව නොමැති අහිතකර පවුල් පරිසරයක් ඇති ගෙවල්වල දරුවන් ඉන් ඉවත් කොට ඔවුන් නීතිමය විධිවිධාන යටතේ ආයතනගත කිරීමට නීතිය මගින් ඉඩ සලස්වා ඇති අතර ඔවුන්ගේ ජීවිතාරක්ෂාව සම්බන්ධයෙන් සිටින ඉහළම භාරකරු වශයෙන් අධිකරණයට පැවරී තිබේ.

මෙවැනි ළමුන්ගේ ගැටළු සහගත තත්ත්වයන් ගැන කටයුතු කරන පරිපාලන ඒකකයක් වශයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 1956 දී පිහිටුවා සහතික කළ පාසල් ක්‍රමය ලංකාවට හඳුන්වාදෙන ලදී. අහිතකර පවුල් පරිසරයක සිටින ගැටළුවලට මුහුණදුන් ගැටවර වයසේ ළමුන් චරිත ශෝධනය සඳහා කිසියම් පුනරුත්ථාපන ක්‍රියාවලියකට ලක් කිරීම සහතික කළ පාසලේ අරමුණයි.

ළමුන් මෙම ආයතනවලට ඇතුළත් කිරීමට හේතුවූ කරුණු පිළිබඳව විමසා බැලීමේදී ගෙවල් බිඳීම, සොරකම, මව්පියන්ට අකීකරු වීම, කලහකාරී බව, මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහි වීම වැනි ක්‍රියාවන්ට දරුවන් පෙළඹී ඇත. සහතික කළ පාසල්ගත අපගාමී චර්යාවන්ට යොමු වූ තියැදියක් තෝරා විධිමත්ව සකස් කරන ලද සම්මුඛ සාකච්ඡා පත්‍රයකට අනුව ලබාගත් තොරතුරු ද ඒ හැරුණු විට ප්‍රත්‍යේක අධ්‍යයන (Case Studies) සිදු කොට එම දරුවන්ගේ පවුල් පසුබිම කවර ආකාරයකින් ඔවුන්ගේ චරිත ලක්ෂණ ප්‍රකට කරන්නේ ද යන්න විමසා බලන ලදී. වෙන් වෙන් වශයෙන් මෙම දරුවන් පිළිබඳ පවුල් පරිසරයේ බලපෑම් තේරුම් ගැනීම සඳහා දෙමාපියන් හා වැඩිහිටියන්ගෙන් ද ක්ෂේත්‍රයට අදාල ආයතන නිලධාරීන්ගේ අත්දැකීම් හා ප්‍රශ්නාවලියෙන් ලබාගත් තොරතුරුත් විශ්ලේෂණය කර නිගමනවලට එළඹීමට කටයුතු කරන ලදී.

ඒ අනුව දරුවන් මෙවන් අපගාමී චර්යාවන්ට යොමු වීම සඳහා ඔවුන් අයත් පවුල් පරිසරය සෘජුවම බලපෑම් කර ඇති බව වටහා ගත හැකි විය. විශේෂයෙන් සමාජ වෙනස්වීමේ ක්‍රියාවලිය සමග නවීන පවුල් ව්‍යුහයේ ව්‍යුහාත්මක වෙනස්වීම නිසා ඇතිවූ විභේදනකාරී තත්ත්වය මාපිය සබඳතා, අඹුසැමි සබඳතා, දූදරු සබඳතා වෙනස් වීම් කෙරෙහි බලපෑම් කර ඇත. මෙම දරුවන්ගේ මව හෝ පියා පවුල අතහැර යාම, වෙන්වීම, දික්කසාද වීම, විදේශගත වීම නිසා බිඳුනු පවුල් පරිසරය තුළින් යොමු වූ දරුවන් වැඩි ප්‍රමාණයකි. මෙම දරුවන් විධිමත් සමාජානුයෝජන ක්‍රියාවලිය බිඳ වැටීම නිසා ඒ ඇසුරින් නිර්මාණය වූ ගැටළු සහිත පසුබිම මෙයට දැඩි ලෙස බලපෑම් කර තිබුණි.

ඉහත සඳහන් කරුණු අනුව අනෙකුත් සංවර්ධනය වන රටවල් හා බලන විට ශ්‍රී ලංකාවේ දාරක සුභසාධනය වෙනුවෙන් සමාජ අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇති බව පෙනේ. දරුවන් කවර හේතුන් නිසා මෙවැනි තත්ත්වයකට පත්ව ඇතිද, ඒ සඳහා කවර සාධක බලපා ඇතිද එම ගැටළු කෙරෙහි අවධානය යොමු කර ඒවාට විසඳුම් සෙවීමට උපකාරී වීම සෑම වැඩිහිටියකුගේම වගකීමක් වන්නේය. එම නිසා මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ මෙතෙක් අනාවරණය නොවූ ක්ෂේත්‍රයක් වෙත අවධානය යොමු කිරීමක් වශයෙන් හැඳින්විය හැකිය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.